# කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
සමාජ ආරක්ෂණ අංශය
# மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு
சமூக பாதுகாப்புபிரிவு
# Ministry of Women, Child Affairs and Social Security
Social SecurityDivision

| | | |
|---|---|---|
| මගේ අංකය : MWCA&SS/ADM/1<br>எனது இல :<br>My No.: | ඔබේ අංකය :<br>உமது இல:<br>Your No.: | දිනය: 2020.04. 06<br>திகதி:<br>Date : |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>කොරෝනා වෛරස ව්‍යාප්තිය හේතුවෙන් සහන සැලසීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ලබා ගැනීම</u>**

ඉහත කරුණ සම්බන්ධව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමතන ලද අංක PUB/ADM/SEC/07 හා 2020.04.06 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව,

01. කොරෝනා වෛරස නිසා අපහසුතාවට පත්ව ඇති ජනතාව වෙත සහන සැලසීම සඳහා විවිධ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අත්‍යාවශ්‍ය රාජකාරි ඉටුකරමින් සිටී.

02. ඇඳිරි නීති හා අනෙකුත් සීමාවන් නිසා රජයේ නිලධාරීන්ගේ නිත්‍ය සේවා ස්ථානවල රාජකාරි සීමා වී ඇති නිසාත්, බොහෝ නිලධාරීන් තම සේවය ඕනෑම අත්‍යාවශ්‍ය ආයතනයක් වෙත ලබාදීමට මේ අවස්ථාවේ සූදානම්ව සිටින නිසාත්, ඕනෑම නිලධාරියෙකු අත්‍යාවශ්‍ය සේවා සඳහා තාවකාලිකව අනුයුක්ත කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය ලබා දී ඇත.

03. එසේ හඳුනාගන්නා නිලධාරියෙකු කිසියම් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක අත්‍යාවශ්‍ය සේවා සඳහා සහයට ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් එම නිලධාරීන් තාවකාලිකව අනුයුක්ත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, එසේ අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ ලැයිස්තුවක් මා වෙත යථා කාලයේදී එවීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

04. අත්‍යාවශ්‍ය රාජකාරි රටතුල කඩිනමින් ක්‍රියාත්මක කර ගැනීම සඳහා අදාල නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් පවරනු ලබන වැඩ සටහන් සඳහා යොමු කර වන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**ඒ.එස්.එම්.එස්. මහානාම**
ලේකම්
කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

පිටපත්

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
02. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස..


| | | |
|---|---|---|
| අමාත්‍ය/ அமைச்சர்/ Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2186241 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 323 |
| රාජ්‍ය අමාත්‍ය/இராஜாங்கஅமைச்சர்/State Minister | දුරකථන/தொ.பே./Tel. : 011 - 2861 145 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2884 613 |
| ලේකම්/செயலாளர்/Secretary | දුරකථන /தொ.பே./Tel. : 011 -2186057 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011 - 2187 249 |
| රාජ්‍ය ලේකම්/இராஜாங்கசெயலாளர்/StateSecretary | දුරකථන /தொ.பே./Tel. : 011-2883 525 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011-2187 007 |
| අමාත්‍යාංශ කාර්යාලය/அலுவலகம்/General Office | දුරකථන/தொ.பே./Tel. : 011 - 2887 349-51 | ෆැක්ස්//பெக்ஸ்/Fax : 011 - 2877 127 |

අමාත්‍යාංශය 1වන මහල, සෙත්සිරිපාය අදියර II,බත්තරමුල්ල.
**அமைச்சு ஆவது மாடி,செத்சிறிபாயகட்டம்II, பத்தரமுல்லை.**
**Ministry**1st Floor,Sethsiripaya Stage II, Battaramulla.

විද්‍යුත්තැපැල/மின்னஞ்சல்/**E-mail** : secycdwa@gmail.com
වෙබ් අඩවිය/இணையத்தளம்/**Website:**www.socialemwelfare.gov.lk